නිවන් අවබෝධ කර ගැනීමට උපකාර වන්නේ
පරම පවිත්‍ර සිරි සද්ධර්මයයි

සෝතාපත්ති ඵලයට පත්වන්නට උපකාරවන
යෝනිසෝ මනසිකාරය හා
නිවන් මග වසා දමන අයෝනිසෝ මනසිකාරය

පරම සත්‍යය පෙන්වා දුන් මහා ප්‍රාඥ අති පූජනීය බුද්ධපුත්‍ර
මීවනපලානේ සිරි ධම්මාලංකාර මහ තෙරුන්වහන්සේ

සුරේන්දු ග්‍රැෆික්ස්
අංක 159, අළුත් තංගල්ල පාර, කොටුවේගොඩ, මාතර.
දුරකථන 041 2227220

නිවන් අවබෝධ කර ගැනීමට උපකාර වන්නේ පරම පවිත්‍ර සිරි සද්ධර්මයයි

සෝතාපත්ති ඵලයට පත්වන්නට උපකාරවන යෝනිසෝ මනසිකාරය හා නිවන් මග වසා දමන අයෝනිසෝ මනසිකාරය

පරම සත්‍යය පෙන්වා දුන් මහා ප්‍රාඥ අති පූජනීය බුද්ධපුත්‍ර
මීවනපලානේ සිරි ධම්මාලංකාර මහ තෙරුන්වහන්සේ

"සියළු බුදුවරුන්ගේ ජන්ම ද්වීපය මේ හෙළ බිමයි"

අනන්ත සසර පටන් මේ මොහොත දක්වා
උදව් උපකාර කල සියලු දෙනාට ඇති අතීත
ණය ගණුදෙනුවෙන් සදහටම අත්මිදීම සඳහාත්,
පිං ගැනීමට පුල පුලා බලා සිටින සියළුම දෙනාට
පිං පවරා සසර දුකින් අත් මිදවීම සඳහාත්
ඉතාම බියකරු සංසාර ගමනෙන්
මිදී නිදහස් වීමට
මඟ පදා දෙමින් මඟ නොමඟ, යායුතු නොයායුතු
පාර අතැඹුලක් සේ දැන දැක මහා කරුණාවෙන්
දේශනා කර වදාරණ
මීවනපලානේ සිරි ධම්මාලංකාර
මහ තෙරුන්වහන්සේට නිරෝගී සුවය සහ
මේ යුග මෙහෙවර විරාත් කාලයක් කරගෙන
යෑමට දීර්ඝායුෂ ලැබේවා යි
අධිෂ්ඨාන කරමු.

යෝනිසෝ මනසිකරණය හා ධම්මානු ධම්ම පටිපදාව

"චත්තාරෝ මේ භික්ඛවේ ධම්මා වඩ්ඩංති, සෝතාපත්ති අංගේ පරිපුරෙන්ති කතමේ චත්තාරෝ ධම්මා "

1. සප්පුරිස සංසේවෝ
2. සද්ධම්ම සවණං
3. යෝනිසෝ මනසිකාරෝ
4. ධම්මානු ධම්ම පටිපත්ති

ඉමේ ඛෝ භික්ඛවේ චත්තාරෝ ධම්මා වඩ්ඩංති සෝතිපත්ති අංගේ පරිපුරෙන්ති, තින්නං සංයෝජනානං පහීයන්ති, සෝතාපත්ති පලං සප්විංකරෝති"

මෙහි සඳහන් කරන ලද්දේ සෝතාපත්ති ඵලයට පත්වීමට නම් යමෙකු විසින් සම්පූර්ණ කරගත යුතු සෝතාපත්ති අංග හතර ගැනයි. මේ ඉහත සඳහන් කරන ලද සෝතාපත්ති අංග හතරම සම්පූර්ණ කර ගැනීමෙන් මිස වෙනත් කිසිම ආකාරයකින් සෝතාපත්ති මාර්ගය සම්පූර්ණ කරගෙන සෝතාපත්ති ඵලයට පත්විය නොහැකිය.

සක්කාය දිට්ඨි, විචිකිච්චිතා, සීලබ්බත පරාමාස යන සංයෝජන තුන ප්‍රහාණය කිරීමද, දිට්ඨි අනුසය විචිකිච්චා අනුසය ප්‍රහාණය කිරීමද, දිට්ඨාසව ප්‍රහාණය කිරීමද, දස්සනේන සම්පන්න තත්වයට පත්වීමද සිදුවන්නේ මේ සෝතාපත්ති අංගයන් හතරම සම්පූර්ණ කර ගැනීමෙනි.

සෝතාපත්ති අංගයන් අතරින් පළමුවැන්න වන සප්පුරිස සංසේවනය - කල්‍යාණ මිත්‍ර සම්පත්තිය - ලබා ගත හැකි වන්නේ

ආර්ය උත්තමයෙකුගෙන්ම පමණි. ඒ ආර්ය ධර්මය අසා දැනගැනීමෙන් , පරතෝගෝෂක ප්‍රත්‍යයය ලබා ගැනීමෙනි.

ආර්ය උත්තමයෙකු දේශනා කරනු ලබන ආර්ය ධර්මය ශ්‍රවණය කිරීමෙන් දෙවන පියවරද සම්පූර්ණ වෙයි. ආර්ය උත්තමයෙකු දේශනා කරන පටිච්චසමුප්පාද ධර්මය අසාදැන ගෙන සෝතාවදානේ පඤ්ඤා සුතමයේ ඥාණය ඥාණය ලැබීමෙන්ම මෙම සෝතාපත්ති අංගයද සම්පූර්ණ වෙයි.

සෝතාපත්ති ඵලයට පත්වීමේදී වඩාත්ම වැදගත් හා මූලිකම අවශ්‍යතාවය වන්නේ යෝනිසෝ මනසිකරණීය ශක්තියයි මෙය බාහිර පුද්ගලයෙකුගෙන් ලබාගත හැකි ආකාරයේ එකක් නොවේ. තමා තුලින්ම, තමන්ම උපද්දවා ලබාගතයුතු , තමන්ටම ලබාගත හැකි ශක්තියකි. කොතරම් බණ ඇසුවත්, කොතරම් කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ලැබුණත්, තමන් යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන්නට නොදන්නේ නම් සෝතාපත්ති අංගයන් කිසිවක්ම සම්පූර්ණ නොවන බවද මතක තබාගත යුතුයි. මිනිසෙකු ලෙසින් උපත ලබා මිනිස් ගුණ ධර්ම දියුණු කර ගැනීමම යෝනිසෝ මනසිකරණ ශක්තිය වඩා වර්ධනය කරගැනීමයි. මෙය ඉෂ්ඨ සිද්ධ කරගත හැකි වන්නේද මිනිස් ආත්ම ප්‍රතිලාභයක් ලද මේ අවස්ථාවේදී මය. ඒ යෝනිසෝ මනසිකාරයෙන් ම ක්‍රියාකිරීමෙනි.

හතරවැනි අංගය වූ ධම්මානුධම්ම පටිපදාවෙහි යෙදීමට නම් කල්‍යාණ මිත්‍රයෙකුගෙන් අසා දැන ගත් සද්ධර්ම මාර්ගය යෝනිසෝ මනසිකාරයෙන් යුක්තව අනුගමනය කල යුතුය. යෝනිසෝ මනසිකාරය නැති කෙනෙකුට ධම්මානු ධම්ම පටිපදාව අනුගමනය කළ නොහැකිය. මේ නිසා යෝනිසෝමනසිකාරයෙන් ක්‍රියාකිරීම සෝතාපත්ති අංග හතර අතරින් ඉතාමත්ම වැදගත් අංගයද වන්නේය.

ලොව්තුරා බුදුවරයෙකු ලොව පහළවන්නේද, බුද්ධත්වයට පත්වී බුද්ධ ධර්මය ලෝකයාට දේශනා කරන්නේද, දෙව් මිනිසුන්ට යෝනිසෝ මනසිකරණය පිළිබඳව කරුණු පහදා මනසිකරණ ශක්තිය දියුණු කර ගන්නට මග කියාදීම සඳහාමය. යෝනිසෝ මනසිකාරණය නොදන්නා මිනිසුන්ට යෝනිසෝ මනසිකාරණයෙන් යුක්තව ක්‍රියාකිරීමෙන් තමා තුලින්ම ලබා ගත හැකි යහපත් - ප්‍රතිඵල - ආදීනව ආනිසංස පෙන්වාදී ඔවුන් යහපත් මාර්ගයට යොමුකරවන්නටමය. අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකිරීමේ අයහපත් ඵලවිපාක පෙන්වා දී, යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකිරීමෙන් ලබන යහපත් ඵලවිපාක මිනිසුන්ට පෙන්වාදීමටය.

මේ අනුව බුදුන් වහන්සේ කෙනෙකුන් බුද්ධත්වයට පත්වීමෙන්ම පෘථග්ජන බොහෝ මිනිසුන්ටද යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියා කරන්නට අවශ්‍ය දැනුම හා නිවැරදි පිරිසිදු මාර්ගය අසා දැන තේරුම් ගන්නටත්, ඒ මාර්ගය අනුගමනය කර ධම්මානුධම්ම පටිපදාව සම්පූර්ණ කරගන්නටත් , සෝතාපන්න ඵලයට පත් වී පෘතග්ජන තත්ත්වයෙන් මිදෙන්නටත් හැකිවන්නේය, මේ අනුව බුද්ධ ධර්මය අවශ්‍ය වන්නේත් අසා දැන ගත යුතු වන්නේත් තේරුම් ගෙන අනුගමනය කිරීම කළ යුතු වන්නේත් අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකිරීම අත්හැර යෝනිසෝ මනසිකරණයයෙන් ක්‍රියාකරන්නට පුරුදු පුහුණු වන්නටමය.

යෝනිසෝ මනසිකරණයෙන් ක්‍රියා නොකරන්නා අයෝනිසෝ මනසිකරණයෙන් ක්‍රියාකරන්නෙකි. මේ අනුව අයෝනිසෝ මනසිකරණ යෙන් ක්‍රියාකිරීම හෙවත් අමනසිකාරය යන්නෙහි අර්ථයද විග්‍රහ කර දැනගැනීම ඉතාමත්ම වැදගත්ය. අසතියෙන් කටයුතු කිරීම, අමනසිකාරයෙන් ක්‍රියාකිරීම, අභාවිත සිතකින් ක්‍රියා කිරීමද, අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකරන කෙනෙකුගේ ලක්ෂණයන්මය. තම චිත්ත සංථානයේ කෙලෙස්ගති, කිළිටිගති,

අඥාණ ගති ගබඩා වී පවතින කෙනෙකුට අයෝනිසෝ මනසිකරණයෙන් මිස යෝනිසෝ මනසිකරණයෙන් ක්‍රියකළ නොහැකිය. රාග ගතිය, ද්වේෂ ගතිය, මෝහ ගතිය තම සිත තුල මුල් බැස ගෙන පවතින නිසාම, කෙලෙස්, ආසව, අනුසය සිත තුලින්ම ක්‍රියාත්මක වී මනස මුවහ වී චිත්ත සංථානය කිළිටිවීම නිසාම මනසිකරණ ශක්තියද වැසි මුවහ වී යයි. ආගන්තුක වශයෙන් බාහිර ලෝකයෙන් චිත්තසංථානය ඇතුලට වැද්ද ගන්නා කෙලෙස්ගති නිතර නිතර පරිහරණය කරන්නට පුරුදු වූ කෙනෙකුට යෝනිසෝමනසිකරණ ශක්තියද නැති වී යයි. පව්කම් දස අකුසලයන් , ආදී ළාමක ධර්ම යම්කිසි කෙනෙක් අතින් ක්‍රියාත්මක වන්නේම හිතට වහල්වී හැඟීමට වහල් වී අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකිරීමෙන්මය.

මෙම සංසාර රිය ගමන දිගින් දිගටම පවත්වාගෙන යාමට අවශ්‍ය සියලුම කරුණු තමන්ම සාදා සකස්කර ගන්නා හා අතීතයේදී සකස් කරගත් ඒවාමය. සංසාර ගැටළුව පිළිබඳව යථාපරිදි තේරුම් නොගත් පෘථග්ජන පුද්ගලයින් අයෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන විට සංසාර ගැටලුවට තාවකාලිකව පිළියම් කරන්නේද සංසාර ගැටලුව තුලින්ම තාවකාලික වෙනසක් ඇති කර ගැනීමෙනි.

දෙවි දේවතා පිහිට පැතීම, පුද පූජා පැවැත්වීම, බලි බිලි දීම, ශාන්ති කර්ම කිරීම ආශිර්වාද පූජා පැවැත්වීම, මෙන්ම යාග හෝම යන්ත්‍ර මන්ත්‍ර කටයුතු කිරීම කරන්නේද මේ ලෞකිකත්වය තුලින්ම යම් කිසි වෙනසක් සහනයක්, සුවයක් තාවකාලිකව ලබා ගැනීමේ ඒකායන අපේක්ෂාවෙනි. මේ ලබන ලෞකික සුවය තාවකාලක බවත්, ඒ තාවකාලික සුවය ලැබූ පසුව යලි ඊටත් වඩා බලවත් සංසාර ගැටළුවකට තමන්ම මැදිවන බවත් තේරුම්

නොගැනීම අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකිරීමකි. අවිද්‍යාව හා තණ්හාව කියන ගති දෙකම යමෙකු තුළ පවතින්නේද යලි යලිත් ඒ ගතිම සිත තුළ උපත ලබන්නේද යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකරන්නට නොදන්නා නිසාමය.

සංසාර ගැටලුවට නිර්මානය කරගන්නේත්, සංසාර රිය ගමන ඉදිරියටත් දිගින් දිගටම පවත්වාගෙන යන්නේත් තමන්ම අවිද්‍යා සංකාර ක්‍රියාත්මක කරන නිසාමය. අවිද්‍යා සංකාර කිරීම හේතු කොට ගෙන ලෝකය තුල තමාම අතරමං වෙයි. මංමුලා වෙයි. නිවනට මඟ වැසී යයි. අවිද්‍යා සංකාර කිරීමේ නියත ප්‍රතිඵලය තම සිත තුල සමුදය බිහිවීමයි. සුගති ලෝකයක උපත ලබන්නට හේතුවන පුන්‍යාභිසංකාර හෝ නිරයේ දුගතියේ උපත ලබන්නට උපකාර වන අපුන්‍යාභි සංකාර හෝ අසඤ්ඤ තලයන්හි උපත ලබන්නට හේතුවන උපකාරවන අනෙජ්ඣාභි සංකාර හෝ යන සංකාර තුන් කොටසම අවිද්‍යාමූල සංකාර ලෙසින් ධර්මයේ විග්‍රහ කර පෙන්වා දෙයි.

කාම ලෝක, දිව්‍ය ලෝක මිනිස් ලෝකය යනාදී සියලු සුගති ලෝක වලද ජාති, ජරා , ව්‍යාධි , මරණ යන සියලුම දුක් පවතී. දුගතියේ , අපායේ ඇති දුක ගැන කිය යුතු නොවේ. අසඤ්ඤ තලයන්හිදී ඇත්තේද තාවකාලික සුවයකි. නැවත අපාගත වීමේ අවදානම, භය මේ සියලුම තලයන්හි පවතී. අපාගත වීමේ අවදානමෙන් සතර අපා බියෙන් සදහටම මිදෙන්නේ සෝතාපත්ති ඵලයට පත්වීමෙන්ම පමණි.

"ධම්මෝ සංදිට්ඨිකෝ" තත්වයට පත්වූ පුද්ගලයාම සංසාර භය දකී. සංසාර ගැටළුවද දකී. "සං" උපත ලබන ආකාරය දැක නොගත් "සං" යථා පරිදි තේරුම් නොගත් "සං" නිසා තම චිත්ත සංථානය කිළිටි වන බව නොදත් පුද්ගලයා ධම්මෝ සංදිට්ඨිකෝ

නොවූ අසංදිට්ඨික" අසම්පඤ්ඤ, අමනසිකාරි අසම්පජානකාරී මොට්ටස්ස පුද්ගලයෙකි. එසේ නම් ධම්මෝ සංදිට්ඨිකෝ තත්වයට පත් වූ පුද්ගලයා යෝනිසෝ මනසිකිරයෙන් ක්‍රියාකරන්නට සමත් පුද්ගලයෙකි.

පරම පවිත්‍ර සිරි සද්ධර්මයම, ආර්ය උත්තමයෙකුගෙන්ම, අසා දැන පටිච්ච සමුප්පාද ධර්මය හේතුඵල ධර්මය තමා තුලින්ම යෝනිසෝ මනසිකරණීය ශක්තියෙන්ම අවබෝධකරගෙන, එයම අනුගමනය කිරීම ධම්මානු ධම්ම පටිපදාවෙහි හැසිරීමයි.

ඇස, කන, නාසය , දිව , කය , මනස යන තමාගේම ඉන්ද්‍රියයන් රූප, ශබ්ද ,ගඳ, සුවඳ රසය , සුව පහස හා ධම්ම යන බාහිර දේවල් වලට පටිච්චවීමේ නියත ප්‍රතිඵලය වන්නේ සමුදය ධර්ම බිහිවී (සංභව) විඤ්ඤාණ ශක්තියක් බිහිවී, සංසාර රිය ගමන යන්නට අවශ්‍ය ශක්තිය දිගටම උත්පාදනය කර දීමයි. හැම පුද්ගලයෙක්ම පෘතග්ජනයෙකු යැයි කියන්නේ හිතට වහල්වී , හැඟීමට වහල් වී ඇස කන, නාසය , දිව, කය , මන ආදී තමන්ගේම ඉන්ද්‍රියයන් පිනවීමේ කැමැත්තෙන් , ආශාවෙන්, තණ්හාවෙන් කටයුතු කිරීමේ පුරුද්දක් ඇතිකර ගත් හෙයිනි. මෙසේ සිතට වහල් වී හැඟීමට වහල්වී ඉන්ද්‍රියයන් පිනවීමේ ක්‍රියාව නිසා තමන්ගේම චිත්තසංථානය කිලිටිවී මනස මොට්ටවී , මෝහයෙන් මුලාවී අමනසිකරණයෙන් ක්‍රියාත්මක වන්නෙකු බවට තමන්ම පත්වෙන බව නොදන්නාකම අවිද්‍යාවයි, ධම්මෝ සංදිට්ඨිකෝ තත්වයට පත් වූ පුද්ගලයාම , එසේ පත්වීමෙන්ම, සමුදය උපත ලැබීමෙන් තම මනස මොට්ට වී, මුවහ වී අමනසිකරණ තත්වයට තමන්ම පත්වන බවද දැකගනී.

ආමිස සුවයක්, සැපතක් සඳහා ඇස කණ, නාසය , දිව , කය මන යන තමන්ගේම ඉන්ද්‍රියයන් පිනවීමේ නොතින් ආශාවෙන් ක්‍රියා කරණ පුද්ගලයා සංසාර දෘෂ්ඨියෙන්ම ක්‍රියා කරන්නෙකි. ඔහු

සම්මා දිට්ඨිය යනු කුමක්දැයි නොදන්නා කෙනෙකි."ධම්මෝ සංදිට්ඨිකෝ" තත්වය අවබෝධ කර නොගත් , සං දැක නොගත් කෙනෙකි.

"අනිච්ච, දුක්ඛ අනත්ත" ලෙසින් බුද්ධ භාෂිතයේ පෙන්වා වදාළ "උතුම් ධර්මතාවය" තේරුම් ගෙන, "නිච්ච, සුඛ, අත්ථ " නැමැති සංසාර ගමනට බැඳ තබන කෙලෙස් ගති උපත ලබන සඤ්ඤාවන් සිතින් ඉවත් කරන්නට ක්‍රියා කිරීම ත්‍රිලක්ඛණ" භාවනාවයි. ත්‍රිලක්ඛණය අවබෝධ කර ගැනිම යනු පදවැල් ටික කටපාඩම් කර ගැනීම පමණක් ද නොවේ. අර්ථ, ධම්ම, නිරුක්ති, පටිභාන සහිතවම යථාපරිදි මේ ක්‍රියාවලිය තේරුම් ගත යුතුයි. මේ පැවැත්ම තුල බාහිර ලෝකයේ බිහි වූ සියල්ල අනිත්‍ය බව දැන නිත්‍ය නොවන බව තේරුම් ගැනීම පමණක් "අනිච්ච" තේරුම ගැනීම නොවේ. තමාගේ ම සිත තුල බිහිවන හටගත් "නිච්ච සඤ්ඤාව", "සුඛ සඤ්ඤාව", "අත්ථ සඤ්ඤාව", තේරුම් ගෙන එවන් සඤ්ඤාවන්හි නියත වූ ස්වභාවය "අනිච්ච, දුක්ඛ, අනත්ථ" බව යථාවබෝධයෙන් අවබෝධ කර ගැනීම ත්‍රිලක්ඛණය අවබෝධ කර ගැනීමයි. " අනිත්‍යයයි, දුක්ඛයි, අනාත්මයි" යන්න වැරදි භාවිතයකි.

"අනිච්ච දේ නිච්ච" සේ දැකීම අයෝනිසෝ මනසිකාරය නිසාම සිදුවෙයි. දුක්ඛ දේ දුක බව නොදැක සුඛසේ සැපසේ දකින්නේද අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකරන්නාය අනත්ත දේ අනත්ත ලෙසින් දැක ගන්නට බැරිව අත්ථ සේ දැක ගන්නේද අයෝනිසෝ මනසිකරණයෙන් ක්‍රියා කරන්නාමය. මේ සංසාර ගැටලුව යලි යලිත් තමන්ම ප්‍රති නිර්මාණය කර ගන්නේම යථාපරිදි ත්‍රිලක්ඛනය අවබෝධ කර නොගැනීමෙනි. අද නිවන් මග සොයමින් භාවනා කරන ගිහි පැවිදි බොහොමයක් දෙනා ත්‍රිලක්ඛණය භාවනා කරන්නේ යථා අවබෝධයකින් තොරවය. ධර්මය නොදැනය. මෙයද අයෝනිසෝ මනසිකරණය නිසාම සිදුවන විශාල හානියකි.

පෘතග්ජන පුද්ගලයා නිරතුරුවම ප්‍රිය මනාප දේවලට ඇලෙයි. අප්‍රිය අමනාප දේවල් සමඟ ගැටෙයි. ප්‍රිය යැයි මනාපයැයි තමන්ම තීරණය කළ දේ අල්ලා උපාදානය කරගනී. අප්‍රිය අමනාප යැයි තීරණය කළ දේ සමඟ වෛර කරයි. ක්‍රෝධ කරයි. මෙසේ ප්‍රිය දේට ඇලෙන්නේ හා අප්‍රිය දේවල් සමඟ ගැටෙන්නේ තමන්ම හුරු පුරුදු කරගත් ගති නිසා බව ඔහු නොදනී. අයෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන එවන් පුද්ගලයා සිතන්නේම මේ ප්‍රිය මනාප බව (ගතිය) ඇත්තේ බාහිර ලෝකයේ බවයි. තමන් ලඟ තමන් තුළ, ඇති මේ කෙළෙස් ගති යථාපරිදි දැකගන්නට අසමත් පුද්ගලයා අයෝනිසෝ මනසිකාරයෙන්ම ක්‍රියාකරන්නෙකි. ඔහු සිතන්නේම මේ ගති ඇත්තේ බාහිර ලෝකයේම බවයි. තමා ලඟ නොවන බවයි.

ප්‍රියදේ සමඟ බැඳෙන, සම්බන්ධ වන හැම අවස්ථාවකදීමත් අප්‍රිය අමනාප දේ සමඟ ගැටෙන , වෛර කරන හැම අවස්ථාවකදීමත් ඒ පුද්ගලයාම සංසාරයට බැඳෙන බැම්මක් යලි තමන්ම සකස් කරගන්නා බව ඔහු නොදනී. මේ අවිද්‍යාව , මෝහය, නොදන්නා කම නිසාම, තමන් තමන්ටම කර ගන්නා හානියකි. මේ ප්‍රිය මනාප දේ කොතරම් ප්‍රිය මනාප දෙයක් උනත් මේ ප්‍රිය මනාප ගති ස්වභාවය මතු වූයේ තමන්ගේම සිතේ බවත් මේ ප්‍රිය මනාප ගති ස්වභාවය බාහිර ලෝකයේ පවතින දෙයක් නොවන බවත්, යථාපරිදි දැක ගන්නට බැරි පුද්ගලයා අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකර ප්‍රිය මනාප දේ උපාදානය කරගෙන සංසාර බැම්මට බැඳෙයි. ඒවාගේම අප්‍රිය අමිහිරි දේ සමඟ ගැටී අමනාප වන පුද්ගලයා සිතන්නේම මේ අප්‍රිය අමනාප ස්වභාවය ඇත්තේ තමාගේ සිත තුල නොව බාහිර පුද්ගලයා , සත්වයා හෝ ධර්මතාවය තුල බවයි. තම සිතේම හටගත් මේ වෛර ස්වභාවය

දැක ගන්නට බැරි වූ අයෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන පුද්ගලයාද සංසාර බැම්මට යලි යලිත් බැඳෙයි.

මෙවන් කෙළෙස් ගති පවතින්නේත් උපත ලබන්නේත් තම චිත්ත සංතානයේම බව යථාපරිදි තේරුම් ගන්නට බැරි , මෙවන් කෙළෙස් ගතිවල "අනිච්ච බව, දුක්ඛ බව, අනත්ථ බව" යථා පරිදි තේරුම්ගෙන ඒ ගත් තම සිතින්ම ප්‍රහාණය කර දමන්නට නොදත් පුද්ගලයා අයෝනිසෝ මනසිකාරයෙන්ම ක්‍රියාකරන්නෙකි. ඔහු සංසාර ගැටලුව නොකඩවාම යලි යලිත් තමන්ම නිර්මාණය කර ගන්නා කෙනෙකි. "යායං තණ්හා පොනොභවිකා" යනුවෙන් ධම්මචක්ක පවත්තන සූත්‍රයේ දේශනා කර පෙන් වූ ධර්මතාවය මෙයයි.

එසේ නම් දස සංයෝජනයන්ම සකස් කරගෙන සංසාර ගමනට නිරන්තරවම බැඳෙන්නේ තමන්ගේම නොදැනුවත්කම (අවිද්‍යාව) හා තණ්හාව නිසාම බව තේරුම් ගත යුතුය. මේ අවිද්‍යාව හා තණ්හාව යන ගති මෙන්ම මානය , මිත්‍යා දෘෂ්ඨිය යන ගතින්ද ඇත්තේ තමන්ගේම චිත්ත සංතානයේ බව සිතන්නට හෝ මෙනෙහි කරන්නට හෝ නොදත් පුද්ගලයා අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියා කරන්නා ලෙසින් ධර්මයේ හඳුන්වා දෙයි.

චතු අරිය සත්‍යයන්ම අවබෝධ කර ගැනීමට හැකිවන්නේද යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කිරීමෙනි. චතු අරිය සත්‍යයන් අවබෝධ කර නොගත් අස්සුතවත් පෘතග්ජන පුද්ගලයා දුප්පඤ්ඤස්ස , අඥාණ පුද්ගලයෙකි. මෙහි අදහස එවන් පුද්ගලයා යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියා කිරීම යනු මොනවාගේ දෙයක් දැයි පවා නොසිතන, නොදන්නා කෙනෙකු වීමයි.

සතියෙහි පිහිටා සතියෙන් යුතුව කටයුතු කරන පුද්ගලයා හේතුඵල දහමට බහා ගලපා බලා ක්‍රියා කරන කෙනෙකි. විනයට සසඳා බලා ක්‍රියාකරන්නෙකි. යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන පුද්ගලයා මෙවන් ගතිගුණ, දක්ෂතා ඇත. අරිය පර්යේෂණයන් කරන පුද්ගලයා නිතරම හේතුඵල දහමට බහා ගලපා බලා කරන කියන හිතන සියලු දේ කරයි. කියයි. හිතයි. ඔහු අරිය මාර්ගය දනී. අනරිය මාර්ගයද දනී, අරිය මාර්ගය අනුගමනය කරයි. අනරිය මාර්ග අත්හරියි.

මෙනෙහි කළ යුතු දේ යථාපරිදි දැන මෙනෙහි කරයි. මෙනෙහි නොකළ යුතු දේ යථා පරිදි දැන මෙනෙහි නොකරයි. මෙවන් පුද්ගලයා ද්වතා අනුස්සතියෙන් යුතුව ක්‍රියාකරන යෝනිසෝ මනසිකාරයෙන්ම කටයුතු කරන මග්ගේමග්ගඤාණ දර්ශනය ලැබූ පුද්ගලයෙකි.

අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකරන පෘතග්ජන පුද්ගලයා කාමවිතක්ක විචාර වලට ඇලෙයි. බැඳෙයි ඒවාට මුලාවෙයි. ව්‍යාපාද විතක්ක වලට ගැටෙයි. ඒවා නිසා තරහ වෛරය තම සිත තුලම බිහි කර ගනී. විහිංසාවිතක්ක විචාර පවත්වා තමන් පිළිබඳවම මානයක් ඇති කර ගනී. මෙසේ කාම විතක්ක විචාර ව්‍යාපාද විතක්ක විචාර, විහිංසා විතක්ක, විචාර පවත්වන්නට පුරුදු වූ පුහුණු වූ පුද්ගලයාගේ සිතෙහි පවතින්නේ අකුසල් සිතිවිලිමය. ඔහු අතින් සිද්ධ වන්නේම පාප කර්මයන්මය. මේ අනුව චිත්තසංතානය කිලිටි කරගෙන, මනස මොට්ට කරගෙන යලි යලිත් අයෝනිසෝ මනසිකාරයෙන්ම ක්‍රියා කරන්නෙකු බවට පත්වෙයි. මෙය ගති පුරුද්දක් බවටද පත්වෙයි. ඔහු අතින් සීලය නොරැකෙයි.

යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකරණ සුතවත් ආර්ය ශ්‍රාවකයා මීට හාත්පසින්ම වෙනස්ය. තම සිතට අරමුණු වන සියලුම අරමුණු කෙරෙහි මනා අවධානයෙන් සිට ("පරිමුඛං සතිං

උපට්ඨපෙත්වා") සිතා බලා හේතුඵල ධර්මයට බහා ගලපා බලා අයහපත් කාම විතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක වෙන්කොට තෝරා බේරා ගෙන ඒවා සිතින් ප්‍රහාණය කර, ඉවත් කර දමන්නටත් (සතෝව පස්ස සති) ඒවාගේම යහපත් අරමුණු වීතරාගී, වීතද්වේශි, විත මෝහි, අරමුණු භාවිතා කරන්නටත් (සතෝව අස්ස සති) දන්නා පුද්ගලයෙකි. මේ ආනාපාන සතියෙහි පිහිටා ක්‍රියා කිරීමේ මුල්ම පියවරයි. මේ ආකාරයට ක්‍රියා කරන ඔහුගේ සිතෙහි කෙලෙස් ප්‍රහාණය වී සිත පිරිසිදු වෙයි. මනසීකරණ ශක්තිය වැඩි දියුණු වෙයි.

යෝනියෝ මනසිකාරයෙන් ක්‍රියාකරන්නට දැනගත් මෙවන් ආර්ය ශ්‍රාවකයා "සංදිට්ඨිකෝ" තත්වයට පත් වුවෙකි. "සං" දැනගත් කෙනෙකි. සංදිට්ඨිකෝ තත්ත්වයට පත් වූ පුද්ගලයා හිතට වහල්වී හැඟීමට වහල් වී කටයුතු කිරීමෙන් ඉවත් වෙයි. ඒ නිසා "සම්මා දිට්ඨියට" පත් වූවෙක් ද වෙයි.

මේ අනුව තමන් අතින් සියලු පව්කම් හා අකුසල කර්මයන් සිදුවන්නේ යෝනිසෝ මනසිකාරයෙන් තොරව ක්‍රියා කිරීම නිසා බව ඔහු තේරුම් ගනී. මෙම දැක්ම සම්මා දිට්ඨියයි. කෙලෙස් වලින් අකුසලයෙන් මිදී නිදහස් විය යුතුය යන පිරිසිදු දැක්මයි.

යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන ආර්ය ශ්‍රාවකයා ස්වාර්ථය මෙන්ම පරාර්ථයද සලකා බලා ක්‍රියා කරයි. තමා කරන කියන හිතන දේක ඵලවිපාක ලෙසින් තමාට සිදුවන යහපත හෝ අයහපත වාගේම අනුන්ට සිදුවන යහපත හෝ අයහපත ගැනද සලකා බලයි. තමන්ම සංසාරයේ අතරමං වන , මංමුලා වන, අපාගත වන ක්‍රියා කිරීමෙන් වැලකී සිටින ඔහු අනුන් ව සංසාරයේ අතරමං කරවන, මංමුලා කරවන, අපාගත වන ක්‍රියාකාරකම් වලින් වැලකෙයි. තමන්ටත් අනුටත් සංසාර බැමි වලින් මිදී නිදහස් විය හැකි දේවල්ම ක්‍රියාත්මක කරයි. තමනුත් මිදී අනෙකාවත් මුදවාලයි.

දේව ආගම් සංකල්පවලට අනුව පුද පූජා පවත්වමින්, ආශිර්වාද පූජා පවත්වමින්, මේ පැවැත්ම , ලෞකික ජීවිතය, තාවකාලිකව සුවපත් කරන්නට, යහපත් කරන්නට, ලෞකික සැප සම්පත් උපාදානය කරගන්නට මිනිසුන් පොළඹවන ආකාරයේ ආගමික සංකල්පවලට මිනිසුන්ව බැඳ තබන්නට උපදෙස් දී මිනිසුන්ව සංසාරයේ අතරමං කරන්නාද අයෝනිසෝ මනසිකාරයෙන්ම ක්‍රියාකරන්නෙකි. මිනිසුන්ට තමන්ගේම මනස මෙහෙයවා මේ පැවැත්ම, ජීවත්වීම පිළිබඳව සත්‍යය ස්වභාවය හෙළි කරදී ඇති තතු යථා පරිදි අවබෝධ කරගන්නට සත්‍යය කියාදීම ආර්යයන් වහන්සේ කෙනෙකුගේ වගකීමයි. මේ ලෞකික පැවැත්ම මොනයම් ආකාරයෙන් හෝ යහපත් එකක් ලෙසින් දිගටම පවත්වාගන්නට දරණ සියලු උත්සාහයන් "අනිච්ච බව , දුක්ඛ බව , අනත්ත බව " පෙන්වා දීම යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකරන බුද්ධ ශ්‍රාවකයෙකුගේ යුතුකමයි.

යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකරන පුද්ගලයා කුසලය, කුසලය ලෙසින් යථාපරිදි දැන හඳුනාගත් කෙනෙකි. අකුසලය අකුසලය ලෙසින්ද යථාපරිදි හඳුනාගත් ඔහු කුසල හා අකුසලය අතර ඇති වෙනස මෙන්ම කුසලය හා පින අතර ඇති වෙනසත් හඳුනාගනී. යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියා නොකරන පුද්ගලයා පිංකමක් කර ගැනීමේදී එයද සංසාර ගමන දික්කර ගන්නා ආකාරයේ අකුසලයක් ලෙසින්ම උපාදානය කරගන්නටම ක්‍රියාකරයි. දෙව් මිනිස් සැප සම්පත් පතමින් කැමැත්තෙන්ම කාම ලෝක වල අතරමං වන්නට පිංකම් කරන බොහෝ පින්වතුන් අදටත් අප අතරම දැකගත හැකිය. ඒ අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියා කිරීමකි. යළි යළිත් සසර දුකම උරුම කර ගැනීම එහි නියත ප්‍රතිඵලය බව ඔහු කල්පනා නො කරයි.

තමන්ගේම මනීන්ද්‍රිය පිරිසිදු කරගෙන නුවණින්, මෙනෙහි කර , සිතට අරමුණු වන සියලු අරමුණු මැන බලා, පෙරා බලා පිරිසිදු කර තෝරාබේරා ගෙන යහපත් අරමුණු පමණක් භාවිතා කිරීමත් අයහපත් කෙළෙස් සහිත අරමුණු භාවිතයට නොගෙන බැහැර කර ප්‍රහාණය කිරීමත් (අස්ස පස්ස) යන දෙයාකාර වූ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නට පුරුදු වූ පුද්ගලයා සතර සති පට්ඨානයෙන්ම ක්‍රියාකරන පුද්ගලයෙකි. මෙම ද්වතා අනුස්සතිය තෝරා බේරා ගන්නට නොහැකිව ප්‍රාණයාම යෝගී ක්‍රම අනුගමනය කරන්නාද අයෝනිසෝ මනසිකාරයෙන්ම භාවනාවන්හි යෙදෙන්නෙකි. මේ අනුව භාවනාවද දෙයාකාරයකි. යෝනිසෝ මනසිකාරයෙන් කරන ආර්ය භාවනාව හා අයෝනිසෝ මනසිකාරයෙන් කරන අනාර්ය භාවනාව යනුවෙනි.

යෝනිසෝ මනසිකාරය යන්න සාපේක්ෂ වශයෙන් ද සලකා බැලිය යුතුය. පෘතග්ජන පුද්ගලයෙක් හොඳ යහපත් නිවැරදි දිවිපෙවෙතක් පවත්වා ගන්නටඅවශ්‍යවන සම්මතයෙන් යහපත් සමාජ සුචරිතයෙහි යෙදෙන්නේද යම්කිසි ආකාරයකින් යෝනිසෝ මනසිකාරයෙන්ම ක්‍රියාකිරීම නිසාමය. එය ලෞකික පැවැත්ම යහපත් දේ දිගින් දිගටම පවත්වා ගෙන යාමටත්, අපායෙන් බේරී සුගතියට පත්වන්නටත් උපකාරවන යෝනිසෝ මනසිකරණය ශක්තියයි.

මාර්ග ඵලයන් ලබාගෙන නිවන් අවබෝධ කරගෙන ලෞකිකත්වයෙන් සදහටම මිදී ඉන් එතෙරවන්නට උපකාර වන්නා වූ ලෝකෝත්තර යෝනිසෝ මනසිකාරය මීට වෙනස් එකකි. මෙහිදී කෙලෙස් මුල් සමුච්ඡේදප් ප්‍රහාණයෙන්ම ගලවා , ඉවත් කර දමා, චිත්ත සංතානය පිරිසිදුකර ගන්නට උපකාරවන ලෝකෝත්තර මනසිකාරය වඩාත් බලවත් එකකි. මෙහිදී යෝනිසෝ මනසිකාරය යන්න "සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා" යන දෙයාකාරයෙන්ම තේරුම් ගෙන කරණීය ධර්ම හා අකරණීය

ධර්මයන් දෙකම ක්‍රියාත්මක කරන්නටත් උපකාරවන්නකි. සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ම සම්පූර්ණ කරගත හැකි වන්නේත් මෙවන් වූ ලෝකෝත්තර යෝනිසෝමනසිකරන ශක්තියෙන් ක්‍රියා කිරීමෙනි. සීල , සමාධි , ප්‍රඥා යන ත්‍රිශික්ෂාවම සම්පූර්ණ වන්නේත් ලෝකෝත්තර යෝනිසෝ මනසිකාරයෙන් යුතුව ක්‍රියා කරන්නෙකු තුළ පමණි.

අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකරන පුද්ගලයා තුළ ලෝභ, ද්වේෂ, මෝහ ගති මෙන්ම මාන දිට්ඨි අවිද්‍යා යන ප්‍රපංච ධර්මයන්ද ක්‍රියාත්මක වන නිසා එවන් පුද්ගලයා ලෞකික දුකෙන් මිදී නිදහස් වන්නට තාවකාලිකව ක්‍රියාත්මක කරන බොහෝ ක්‍රියාකාරකම් වලින්ද සිදුවන්නේ තව තවත් පංචස්කන්දයම උපාදානය කරගෙන සංසාරයට තව තවත් බැඳී ණය වීමයි. මාරයාට නැවත් නැවත ණය වීමයි.

ලෞකිකත්වය තුළින්ම තාවකාලික සහනයක් සුවයක් විමුක්තියක් සොයන මෙවන් පෘතග්ජන පුද්ගලයා පුන්‍යාභිසංකාර කරමින් එයද උපාදාන කරගෙන කාමලෝකවල අතරමං වෙයි. තවත් බොහෝ අය අනාර්ය භාවනාවන් වල යෙදීමෙන් අනෙඤ්ජාභිසංකාර කරමින් අනාර්ය ධ්‍යානයන් ලබාගෙන අසඤ්ඤ තලයන්හි අතරමං වෙයි. මේ කොටස් දෙකම අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකරන පුද්ගලයන්ය. ඔවුන් සත්‍යය දැනගෙන ක්‍රියාකරන්නන් යයි සිතාගෙන ක්‍රියාකරන නමුත් තම තමන්ගේම නොදැනුවත් බව නොදන්නා අය වෙති. එවන් අය තම නොදැනුවත් කම නිසා තමන් සංසාරයේ අතරමං වීමට අමතරව තවත් බොහොමයක් අනුගාමිකයින්ද සංසාරයේ කල්ප කාලාන්තරයක් අතරමං කිරීමට ක්‍රියා කරති. මෙයද අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයන්මය.

පුන්‍යාභි සංකාර, අපුන්‍යාභි සංකාර හා අනෙඤ්ජාභි සංකාර යන අවිද්‍යා මූල සංකාරයන් මෙන්ම කුසලාභි සංකාරයන් ගැනද දැන තේරුම් ගත් පුද්ගලයා කළ යුතු දේ හා නොකළ යුතු දේ ගැනද තේරුම් ගත් කෙනෙකි. ඔහු නිතරම කුසලාභි සංකාර

කරමින් සසර ගමන නිමා කරන්නට උත්සාහ දරන යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියා කරන්නෙකි. එවන් උත්තමයාම බාහිර ලෝකයාටද කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ලබාදෙන්නටත් පරතෝගෝෂක ප්‍රත්‍යය ලබාදෙන්නටත් සමත් කෙනෙකුන් වෙයි.

කෙලෙස් නසා දමා මාර්ග ඵල ලබාගත යුතු බව දේශනා කර පෙන්වා දුන්නත්, ප්‍රායෝගිකවම කුසලාභි සංකාරයන් පැවැත්වීම මගින් කෙලෙස් ප්‍රහාණය කරන ප්‍රායෝගික වැඩ පිළිවෙළ ලෝකයාට ආදර්ශවත් ලෙසින්ම පෙන්වා දෙන්නට අසමත් නම් එතැනද යෝනිසෝ මනසිකාරයෙන් යුක්තව ධර්මයෙහි හැසිරීමක් (චරේථ ධම්මෝ) නැත.

ලෞකිකත්වය තුළම තමන්ද අතරමං වන බාහිර ලෝකයාවද අතරමං කරවන, පිංකම් කරන්නටම පමණක් ලෝකයාට උපදෙස් දීම පවිත්‍ර බුද්ධ ධර්මය නම් නොවේ. ලෞකිකත්වයෙන් එතෙරවන්නට උපකාරවන කෙලෙස් මුල් ගලවා දමන්නට උපකාර වන බුද්ධ ධර්මයම ලෝකයාට දේශනා කර පහදා දිය යුතුය. එයම පරම පවිත්‍ර බුද්ධ ධර්මයයි.

මේ අනුව සෝතාපත්ති අංගයන් හතරම සම්පූර්ණ කර ගන්නට නම් ධම්මානු ධම්ම පටිපදාවෙහි යෙදී ක්‍රියාකරන්නට නම් යෝනිසෝ මනසිකාරයෙන්ම කටයුතු කරන්නෙකු වීම අනිවාර්යම සාධකයකි.

සම්මස්සන ඥාණයන්, සතර සම්මප්ප්‍රධානයන්, සතර ඉද්ධිපාදයන් සම්පූර්ණ කරගෙන සතර සති පට්ඨානයෙහි යෙදී සතර මඟ සතර ඵලයන් ලබා ගත හැකි වන්නේ යෝනිසෝමනසිකාරයෙන් ක්‍රියාකරන මිනිසෙකු බවට පත්වීමෙන්ම පමණි.

තමන් කොතරම් දුරට යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන පුද්ගලයෙක්ද? එසේ නැති නම් තමන් කටයුතු කරන්නේ අයෝනිසෝ මනසිකාරයෙන්ද යන්න දැන ඔබටම තීරණය කර ගන්නට මෙහි සඳහන් කරන ලද කරුණු සාවධානව සලකා සිතා බලන්න. දැන් ඔබේම යහපත සඳහා ඔබ ගැනම ඔබ කල්පනා කර මේ කරුණු එකින් එක සලකා බලා තීරණයක් ගත යුතුයි.

උපන් හැම සත්වයාම සසර දුක් විඳීමට හා සංසාර දුක නිර්මාණය කර ගන්නට මූලිකම හේතුව ඒ ඒ සත්වයාම පුද්ගලයාම අයෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකරන්නට පුරුදු වීමයි.

මිනිසෙකු ලෙසින් උපත ලැබූ ඔබට යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකර මනස පාවිච්චි කර සසර දුකෙන් සඳහටම මිදී නිදහස් වන්නට උතුම් අවස්ථාවක් අද උදාවී ඇති බව සිතන්න. වෙන කාටවත් ඔබේ චිත්ත සංතානය හෝ මනස කිළිටි කර, කෙලෙස් වලින් පුරවා නිවන ආවරණය කරන්නට නොහැකිය. ඔබේ චිත්ත සංතානය කිලිටි කර ගන්නේද මනස මොට්ට කර ගන්නේද ඔබමය. ඔබේ චිත්ත සංථානය පිරිසිදු කරගෙන, මනස මුවහත් කරගෙන කෙලෙස් බැමි කපා දමන්නට හැකි වන්නේද ඔබටමය.

මිනිසෙකු ලෙසින් මනුස්සයෙකු ලෙසින් උපත ලැබූ ඔබට දැන් ලැබී තිබෙන, උරුමයෙන්ම ලැබුණු උසස්ම දේ මනීන්ද්‍රියයි. ඔබේ මනීන්ද්‍රිය පිරිසිදු කරගෙන මානසිකත ශක්තිය යෝනිසෝ මනසිකරණය ශක්තිය ඔබටම උපදවා ගත හැකි උතුම්ම ශක්තියයි. එය බුද්ධ ශක්තිය ලබන්නට උපකාර වන එකම ධර්මතාවයයි.

ඒ නිසා පිරිසිදු බුද්ධ ධර්මයම අසා දැන ධර්මයෙහි හැසිරෙන්න. සංසාරයේ අතරමං වන බොහෝමයක් දේව ආගමික සංකල්ප වලින් බැහැර වන්න. එවිට ඔබටත් යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියාකරන්නට සුදුසු වාතාවරණයද සකස් කරගත හැකිවෙනු ඇත.

"අයෝනිසෝ භික්ඛවේ, මනසිකරෝතෝ අනුප්පන්නා වේව ආසවා උප්පජ්ජති, උප්පන්නාව ආසවා පවඩ්ඩන්ති" යෝනිසෝ බෝ භික්ඛවේ මනසිකරෝතෝ අනුප්පාන්නා වේව ආසවා න උප්පජ්ජති, උප්පන්නාව ආසවා පහීයන්ති"

මේ සබ්බාසව සංවර පරියාය සඳහා කල දේශනාවයි.

"සබ්බ දානං ධම්මදානං ජිනාති"

වීදාගම මෛත්‍රී පාරේ "සඳමාලී " නිවසේ සිට 2012.05.07 දින පරලොව සැපත් හෙට්ටිගේ නන්දාවතී පෙරේරා මැතිනියට සහ දෙපාර්ශයේම පරලෝ සැපත් දෙමාපියන්, සොයුරු සොහොයුරියන් ඇතුළු සියළු ඥාති හිතමිත්‍රාදීන්ට පිං අනුමෝදන් කිරීමටත් මෙම ධම්ම ග්‍රන්ථය නැවත මුද්‍රණය කර බෙදා දීමෙන් ලැබෙන ධර්මදානමය පින හේතු වේවායි පතමි.

"සඳමාලි"
මෛත්‍රී පාර,
වීදාගම,
බණ්ඩාරගම
2019.07.05